Centre for Equality and Justice

# කාන්තාවන් හා හානිපූරණය පිළිබඳ ඉදිරි මාවත පිළිබඳ සිවිල් සමාජ ප්‍රකාශය

පහත දැක්වෙන ප්‍රකාශය ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා හානිපූරණය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ හානිපූරණය සඳහා ඉදිරි මාවත තක්සේරු කිරීමට සිවිල් සමාජ සංවිධාන සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් සමඟ සමානාත්මතාවය හා යුක්තිය සඳහා වන කේන්ද්‍රය (CEJ) විසින් ජූලි 28 වන දින සංවිධානය කරන ලද රැස්වීමක ප්‍රතිඵලයකි.

සංක්‍රාන්තික යුක්තියේ සහ සංහිඳියාවේ අනාගතය පිළිබඳව විශේෂයෙන්ම අගතියට පත් පාර්ශ්වයන්ට තනි පුද්ගල හා සාමූහික හානිපූරණයට ශ්‍රී ලංකා රජයට ඇති වගකීම සම්බන්ධයෙන් පහතින් අත්සන් කරන්නට යෙදුණු සිවිල් සමාජයේ තනිපුද්ගලයන් හා සංවිධාන ලෙස අපගේ දැඩි අවධානය යොමුකර සිටී.

පරිපාලනය වෙනස්වීම, ගෝලිය වසංගතය හා නුදුරේදීම ඇතිවීමට නියමිත ගෝලීය ආර්ථික අර්බුදය යන සන්දර්භය තුළ කිසිඳු අගතියකට යටත් නොවී 2018 අංක 34 දරණ හානිපූරණය පිළිබඳ කාර්යාලය පනතේ හානිපූරණයට අදාළ ප්‍රතිපාදන සමඟ මෙතෙක් සිදුකළ ප්‍රගතිය ඉදිරියටද අඛණ්ඩව පවත්වාගෙන යාම සිදු කළ යුතු කාර්යයකි.

ඵලදායී පිළියමක් සඳහා ඇති අයිතිය සමඟ අවිවාදයෙන්ම සම්බන්ධ වී ඇති නිසඟ ගෞරවය, හා සමානාත්මතාවය, හා අවශේෂ කළ නොහැකි මානව හිමිකම්වලට ගරු කිරීම, සුරක්ෂිත කිරීම සහ ඉදිරියට ගෙන යාම සඳහා රජය සතු වගකීම හඳුනාගෙන හානිපූරණය සඳහා වන විධිවිධාන කඩිනම් කරන ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු. ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ එවැනි කිසිදු පදනමක් මත නොසලකා සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම්වල අත්‍යවශ්‍ය අංගයක් ලෙස හානිපූරණ ක්‍රමය අප හඳුනාගැනීම අත්‍යවශ්‍ය වේ.

හානිපූරණය පිළිබඳ කාර්යාලයේ කාර්යක්ෂමතාවයට බාධා පමුණුවන පරිපාලන හා කාර්ය පටිපාටික බාධක විමසා බලා විධිමත් ලෙස ආමන්ත්‍රණය කිරීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව, හානිපූරණය පිළිබඳ කාර්යාලය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය කඩිනමින් ලබා දීමට යාන්ත්‍රණ අනුගමනය කරමින් හානිපූරණයට පහසුකම් සපයන ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු.

හානිපූරණය, යුක්තියේ ස්වරූපයක් ලෙස සලකන ලෙසත්, “ප්‍රමාද වූ යුක්තිය, යුක්තිය ප්‍රතික්ෂේප කරන බවත්” පිළිගන්නා ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු.

හානිපූරණය පිළිබඳ කාර්යාලයේ සේවාවන් සඳහා දැනට පවතින ප්‍රවේශ මට්ටම් අඩු මට්ටමක පවතින බැවින් ජංගම සායන හරහා සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජය දිරිමත් කර සිටී.

**මෙම පොදු සන්දර්භය තුළ අප විසින් රජයට දිරිගන්වනුයේ:**

- හානිපූරණය පිළිබඳ කාර්යාලයේ විධිවිධාන මූල්‍යමය වන්දි සැපයීමට පමණක් සීමා නොකර පුළුල් ලෙස අර්ථ නිරූපණය කර අදාළ කර ගැනීම;
- පනතේ පැහැදිලිවම සපයා ඇති වෙනත් ආකාරයේ හානිපූරණ ලබා දීමට පියවර ගැනීම;
- පනතේ පැහැදිලිව සපයා නොමැති හානිපූරණය කිරීමේ ක්‍රම ගවේෂණය කිරීම සහ හානිපූරණය සඳහා අර්ථවත් හා මානුෂීය ප්‍රවේශයක් අනුගමනය කිරීම තුළින් ඒවා ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බැලීම;

- දැනුම හෝ දැනුවත්භාවය නොමැතිකම, භූගෝලීය පිහිටීම්, උල්ලංඝනය කිරීම් හෝ අලාභයෙන් පසු ගත වූ කාල සීමාව සහ/හෝ විශේෂයෙන් අවදානමට ලක්විය හැකි වතු ප්‍රජාව හෝ අභ්‍යන්තරව අවතැන් වූවන් වැනි කණ්ඩායම්වලට අයත් වීම හේතුවෙන් හානිපූරණයක් නොමැතිව තවමත් පවත්නා ශ්‍රී ලංකාවේ භූගෝලීය ප්‍රදේශ සහ ප්‍රජාවන් ලෙස හානිපූරණය තක්සේරු කිරීම;

- හානිපූරණය පිළිබඳ කාර්යාලයේ සේවය සන්නද්ධ ගැටුමේ කාල පරිච්ඡේදයට පමණක් සීමා නොවන බවත්, සන්නද්ධ ගැටුමට පෙර සහ පසුව ඇති වූ කැරලි සහ ගැටුම් ආවරණය කරන බවත් පැහැදිලිව ප්‍රකාශ කිරීම;

- හානිපූරණය පිළිබඳ කාර්යාලය හරහා රට පුරා වැඩිමනක් ක්‍රියාකාරකම් සිදු කිරීම සහ බලපෑමට ලක්වූ ප්‍රජාවන්ට සහ පුද්ගලයන්ට හානිපූරණය කිරීම කාර්යක්ෂමව සැපයීම;

- කාන්තා ගෘහ මූලිකයන්ට තිරසාර ආදායම් උත්පාදනය කිරීමේ විකල්පයන් ඇති බව සහතික කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ඔවුන් අත්විඳින ලද වෙනත් අලාභයන්ට හානිපූරණය කිරීම සඳහා හානිපූරණය පිළිබඳ කාර්යාලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග යටතේ රැකියා සුරක්ෂිතභාවය ලබා දීම;

- හානිපූරණය පිළිබඳ කාර්යාලයේ නිලධාරීන් සහ අනෙකුත් රජයේ ආයතන අගතියට පත් පාර්ශ්වයන්ගේ දුක්ගැනවිලි පිළිබඳව සංවේදී කිරීම, සියලු නිලධාරීන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී බව සහතික කිරීම;

- ඕනෑම ආකාරයක ලිංගික හිංසනයකට මුහුණ දී ඇති අය ඇතුළුව සියලු ආකාරයේ අගතියට පත් පාර්ශ්වයන්ට හානිපූරණය පිළිබඳ කාර්යාලයට ප්‍රවේශය ඇති බවට සහතික වීම;

- හානිපූරණය පිළිබඳ කාර්යාලයට පිවිසෙන අයගේ අවශ්‍යතා රහස්‍යභාවයෙන් සලකන බවටත්, අවශ්‍ය විටෙක කාන්තාවන්ට අවශ්‍ය උපදේශන සහ මානසික සෞඛ්‍ය සේවා ලබා දෙන බවටත් සහතික වීම;

- හානිපූරණය පිළිබඳ කාර්යාලයෙන් සේවා ලබා ගන්නා කාන්තාවන් ඔවුන්ගේ දුක් වේදනා පිළිබඳ විස්තර තුළින් නැවත පෙර තත්වයට පත්වීම නොවන බවට සහතික වීම සහ කාන්තාවන්ට ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා වන මානුෂීය ආකාරයකින් කටයුතු කිරීම සහතික කිරීම;

- හානිපූරණය පිළිබඳ කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදීතාව පිළිබඳ පුහුණුව ලබා දීම;

- හානිපූරණය පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය, එහි ප්‍රාදේශීය මධ්‍යස්ථාන ද ඇතුළුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවලින් ප්‍රවීණ බව සහතික කිරීම;

- රට පුරා සිටින අගතියට පත් පාර්ශ්වයන්ට පහසුවෙන් ප්‍රවේශ වීම සහතික කිරීම සඳහා හානිපූරණය පිළිබඳ කාර්යාලයේ කටයුතු විමධ්‍යගත කිරීම;

- විශේෂයෙන් කාන්තාවන් අතර හානිපූරණය පිළිබඳ කාර්යාලයට ප්‍රවේශ වීම ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැපයීම;

- හානිපූරණය පිළිබඳ කාර්යාලය ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රජාවන්ට සමානව ප්‍රවේශ විය හැකිය යන මතය සාමාන්‍ය ජනතාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය දක්වන යාන්ත්‍රණ ඇති බවට සහතික වීම;

- විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වන කාන්තා ගෘහ මූලිකයන්, ආබාධ සහිත පුද්ගලයින්ට ගෞරවයෙන් හා ගරුත්වයෙන් සලකනු ලබන බවට සහතික වීම සහ ඔවුන්ට හානිපූරණය කාර්යක්ෂමව ලබා දීම;

- සන්නද්ධ ගැටුමේදී මියගිය හෝ අතුරුදහන් වූ හමුදා නිලධාරීන්ගේ වැන්දඹුවන් සහ හමුදා නිලධාරීන්ගේ පවුල් සම්බන්ධයෙන් හානිපූරණය පිළිබඳ කාර්යාලයේ ප්‍රතිපත්තිය පැහැදිලි කිරීම;

- හානිපූරණය සම්බන්ධයෙන් පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව වැනි අනෙකුත් රාජ්‍ය ආයතන සංවේදී වී ඇති බවත්, හානිපූරණය සඳහා ඉල්ලුම් කිරීම සඳහා එවැනි වාර්තා අවශ්‍ය වූ විට අගතියට පත් පාර්ශ්වයන්ට කඩිනම් ක්‍රියාදාමයන් හරහා පොලිස් වාර්තා ලබා දෙන බවත් සහතික කිරීම;

- පුනරුත්ථාපනය කර සමාජයට නැවත ඒකාබද්ධ කරන ලද හිටපු කාන්තා සටන්කාරිනියන් සම්බන්ධයෙන් හානිපූරණය පිළිබඳ කාර්යාලයේ ස්ථාවරය පැහැදිලි කිරීම;

- සන්නද්ධ ගැටුමේදී රාජකාරියේ යෙදී සිටියදී ජීවිත අහිමිවූ සිවිල් සේවකයින්ගේ/රජයේ සේවකයින්ගේ පවුල් සම්බන්ධයෙන් හානිපූරණය පිළිබඳ කාර්යාලයේ ප්‍රතිපත්තිය ප්‍රකාශ කිරීම;

- අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා හානිපූරණය පිළිබඳ කාර්යාලය සහ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විසින් සපයනු ලබන සේවාවන් ඒකාබද්ධ කිරීම;

- බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ සාමය හා සමගිය විදහා දැක්වීමේ අදහසින් අහිමි වූ ආදරණීයයන් අනුස්මරණය කිරීම පුරුෂයින් පිළිබඳ මිලිටරීකෘත මතයන්ට වඩා වෙනස්ව අපේක්ෂා කරන්නේ කෙසේදැයි තක්සේරු කිරීම;

- හානිපූරණ ක්‍රියාවලියට වින්දිතයින්ගේ මැදිහත්වීම වෙනුවෙන් අනුස්මරණ අඩවි ප්‍රවර්ධනය කළ යුතු බව හඳුනා ගැනීම;

- සන්නද්ධ ගැටුමේ කුමන හෝ වේලාවකදී අවතැන්වූවන්ගේ කඳවුරුවලට කොටු වී සිටින අයට ප්‍රමාණවත් හානිපූරණයක් ලබා දෙන බවට සහතික වීම;

- තිරසාර සාමය, ගැටුම් නිරාකරණය සහ හානිපූරණය සඳහා කාන්තාවන්ගේ දායකත්වය පිළිගැනීම;

- ශ්‍රී ලංකාවේ ගැටුම් සන්දර්භය තුළ ඉඩම් හා දේපළ අහිමි වූ කාන්තාවන් සඳහා හානිපූරණය පිළිබඳ කාර්යාලය ද හානිපූරණය ලබා දෙන බවට සහතික වීම; සහ,

- ජාතිය, ආගම, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වෙනත් කිසිදු නිර්ණායකයක් මත පදනම්ව වෙනස්කම් කිරීමකින් තොරව හානිපූරණය පිළිබඳ කාර්යාලය හරහා අතීතයේ දී අහිමි වූ හා දුක් විඳින ලද ජීවිත සිහිපත් කිරීම සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සමානාත්මතාවයට ඇති මූලික අයිතිය හානිපූරණය පිළිබඳ කාර්යාලයේ වැඩ කටයුතුවලදී සහතික කිරීම.

**අතීතයේ සිදු වූ හානිවලට පිළියම් යෙදීම සඳහා හානිපූරණය පිළිබඳ කාර්යාලය ඵලදායී ලෙස යොදා ගන්නා ලෙසත්, යුක්තිය සහ විධිමත් පිළියමක් වෙනුවෙන් සියලු මිනිසුන්ට ඇති සහජ අයිතිය කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ සංහිඳියාව උදෙසා මංපෙත් විවර කරන ලෙසත් අපි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු.**